# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**11 ශ්‍රේණිය**

**කෘෂි හා ආහාර තාක්ෂණය - I**

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 1 යි

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) අතීතයේ ශ්‍රී ලංකාවේ පැවති දියුණු වාරි තාක්ෂණය පිළිබඳ කදිම නිදසුනක් වන යෝධ ඇළ ඉදිකරන ලද්දේ,
1) නිශ්ශංක මල්ල රජතුමා විසිනි
2) ධාතුසේන රජතුමා විසිනි
3) වසභ රජතුමා විසිනි
4) මහසෙන් රජතුමා විසිනි

02) උතුරු, උතුරුමැද හා නැගෙනහිර පළාත් වලට වාර්ෂිකව වැඩිම වර්ෂාපතනයක් ලැබෙනුයේ
1) සංවහන වර්ෂාව මගිනි
2) වාසුළි වර්ෂාව මගිනි
3) ඊසානදිග මෝසම් වර්ෂාව මගිනි
4) නිරිතදිග මෝසම් වර්ෂාව මගිනි

03) පහත දැක්වෙන වගුවෙහි කාලගුණික පරාමිතිය, මනින උපකරණය හා ඒකකය නිවැරදිව දක්වා ඇති පේළිය කුමක්ද?

| | කාලගුණික පරාමිතිය | මනින උපකරණය | ඒකකය |
|---|---|---|---|
| 1) | සුළඟේ වේගය | අනිලමානය | පැයට කිලෝමීටර් |
| 2) | ආර්ද්‍රතාවය | උෂ්ණත්වමානය | ෆැරන්හයිඩ් |
| 3) | වර්ෂාපතනය | වර්ෂාමානය | මිලි ලීටර් |
| 4) | ආලෝක තීව්‍රතාවය | සූර්ය දීප්තමානය | ලක්ස් |

04) ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාප විවිධ සංකේත වලින් හඳුන්වන අතර WL හා DL යන සංකේත වලින් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
1) උඩරට අතරමැදි කලාපය හා උඩරට තෙත් කලාපයයි
2) මැදරට අතරමැදි කලාපය හා පහතරට වියළි කලාපයයි
3) උඩරට අතරමැදි කලාපය හා පහතරට තෙත් කලාපයයි
4) පහතරට තෙත් කලාපය හා පහතරට වියළි කලාපයයි

05) පසෙහි කලිල ප්‍රමාණය වැඩිවීම සාරවත් බවට හේතු වේ. පසේ අඩංගු කලිල වර්ග වනුයේ
1) මැටි හා රොන් මඩ ය
2) මැටි හා හියුමස් ය
3) වැලි හා මැටි ය
4) රොන්මඩ හා හියුමස් ය

06) අහඹු ලෙස ලබාගත් පස් සාම්පල හතරක පාංශු සංඝටකවල සාපේක්ෂ ප්‍රතශත පහත වගුවේ දක්වා ඇත.

| | ජලය (%) | වාතය (%) | ඛනිජ (%) | කාබනික ද්‍රව්‍ය (%) |
|---|---|---|---|---|
| A | 25 | 25 | 20 | 30 |
| B | 40 | 15 | 40 | 5 |
| C | 5 | 20 | 60 | 15 |
| D | 25 | 25 | 45 | 5 |

ඉහත පස් සාම්පල අතරින් බෝග වගාවට වඩාත් සුදුසු පස් සාම්පලය වන්නේ
1) A ය
2) B ය
3) C ය
4) D ය

07) පසක කැටායන හුවමාරු ධාරිතාවය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A- වැලි පසට සාපේක්ෂව මැටි පසේ කැටායන හුවමාරු ධාරිතාවය වැඩිය.

B- කැටායන හුවමාරුධාරිතාවය වැඩි පස සාරවත් පසකි.

C- පසට වැලි මිශ්‍ර කිරීමෙන් කැටායන හුවමාරු ධාරිතාවය වැඩි දියුණු කළ හැකිය.

ඉහත ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි ප්‍රකාශ වන්නේ

1) A හා B පමණි 2) A හා C පමණි 3) B හා C පමණි

4) A, B හා C යන සියල්ල ම

08) ආම්ලික පසක් බෝග වගාවට සුදුසු තත්ත්වයට පත් කිරීමට යෙදිය යුතු වන්නේ

1) ජිප්සම්ය 2) ගෙන්දගම්ය

3) කැල්සියම් කාබනේට් ය 4) කාබන් ය

09) බඳුනක සිට වූ මිරිස් පැළ කිහිපයක් වියළි කාලගුණය හේතුවෙන් මැළ වී වියළී ගියේය. එම අවස්ථාවේ මෙම බඳුන්වල පසෙහි තිබිය හැක්කේ

1) ගුරුත්වාකර්ෂක හා ජලාකර්ෂක ජලය පමණි

2) ජලාකර්ෂක ජලය පමණි

3) කේෂාකර්ෂක ජලය පමණි

4) කේෂාකර්ෂක ජලය හා ජලාකර්ෂක ජලය පමණි

10) කුල අනුව බෝග වර්ගීකරණය පිළිබඳව ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A- බටු, මිරිස් හා තක්කාලි සොලනේසි කුලයට අයත් බෝග වේ.

B- මුං, කඩල හා මෑ ෆැබේසියේ කුලයට අයත් බෝග වේ.

C- වී, බඩඉරිඟු හා කුරහන් කුකර්බිටේසියේ කුලයට අයත් බෝග වේ.

මෙම ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ වන්නේ

1) A හා B ය 2) A හා C ය

3) B හා C ය 4) A, B හා C ය

11) බිම් සැකසීමේ උපකරණ පිළිබඳව විස්තර සහිත වගුවක් පහත දැකවේග

| | ප්‍රාථමික බිම් සකස් කිරීමේ උපකරණ | ද්විතියික බිම් සකස් කිරීමේ උපකරණ | අතුරුයත් ගැමේ උපකරණ |
|---|---|---|---|
| A | උදළු මුල්ලුව | උදැල්ල | කොකු නගුල |
| B | තැටි නගුල | රිජරය | ජපන් රොටරි වීඩරය |
| C | අත් මුල්ලුව | ගැමි ලී නගුල | දැති පෝරුව |
| D | උදැල්ල | අත් ඉස්කෝප්පය | රේක්කය |

මෙම වගුවේ බිම් සැකසීමේ අවස්ථාව අනුව උපකරණ සියල්ල නිවැරදි අනුපිළිවෙළට දක්වා ඇති පේළිය වන්නේ

1) A ය 2) B ය 3) C ය 4) D ය

12) වැටි හා කාණු පාත්තිවල සිටුවීමට නිර්දේශිත බෝග වර්ග වනුයේ

1) බටු, මිරිස් හා තක්කාලි 2) ඉරිඟු, කහ බඩඉරිඟු ය

3) බතල, ඉන්නල හා රටකජු ය 4) කැරට්, බීට් හා ලීක්ස් ය

13) බෝග වගාව සඳහා කරනු ලබන බිම් සකස් කිරීම සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය කුමක්ද?

1) බිම් සැකසීමෙන් බෝග වර්ධනයට හිතකර පාංශු තත්ත්වය සපයනු ලැබේ.

2) හොඳින් බිම් සැකසීම මගින් වල් පැළ පාලනය වේ.

3) බිම් සැකසීමෙන් පසේ ජල අවශෝෂණ හැකියාව දියුණු වේ.

4) අතුරුයත් ගැම සිදුකරනු ලබන්නේ බෝග සංස්ථාපනයට පෙර ය.

14) ක්ෂේත්‍රයේ සිටුවීමේ දී පැළයේ මුල් වලට සිදුවන හානි අවම කර ගැනීම සඳහා සකසනු ලබන තවාන් වර්ග වන්නේ

1) නොරිදෝකෝ තවාන් ය
2) ඩැපොග් තවාන් ය
3) මඩ තවාන් ය
4) ගිල් වූ තවාන් ය

15) බීජ තවාන් දැමීමට පෙර තවාන් මාධ්‍ය ජීවානුහරණය කරනු ලබන්නේ

1) පසට ශාක පෝෂක එකතු කිරීමටය
2) පසේ ජලවහනය වැඩි දියුණු කිරීමටය
3) පළිබෝධ හානි පාලනය කිරීමටය
4) බීජ ප්‍රරෝහණය වේගවත් කිරීමටය

16) බෝග වගාවන් නඩත්තු කිරීමේ දී කරනු ලබන ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

A- පසට වසුන් යෙදීම
B- පසට රසායනික පොහොර මිශ්‍ර කිරීම
C- වල් පැළෑටි ඉවත් කිරීම
D- ශාක කප්පාදු කිරීම හා පුහුණු කිරීම

මෙම ක්‍රියාකාරකම් අතුරින් පාංශු ජලසංරක්ෂණය සඳහා හේතු වන ක්‍රියාකාරකම් වන්නේ

1) A හා B ය
2) A හා C ය
3) A හා D ය
4) B හා D ය

17) වගා භූමියේ රැඳී ඇති අතිරික්ත ජලය ඉවත් කිරීමෙන්

1) පසේ නිර්වායු ක්ෂුද්‍ර ජීවී ගහනය වැඩිවේ.
2) පසේ කාබනික ද්‍රව්‍ය ජීර්ණයට බාධා ඇති වේ.
3) කෘෂි උපකරණ භාවිතය අපහසු වේ.
4) පසේ වාතනය දියුණු වේ.

18) බඩඉරිඟු වගාවක පත්‍ර දර පිළිස්සුණු ස්වභාවයක් හා පත්‍ර කහපාට වීම නිරීක්ෂණය විය. මෙම තත්ත්වයට හේතුව විය හැක්කේ

1) පොටැසියම් ඌණතාවයයි
2) නයිට්‍රජන් ඌණතාවයයි
3) මැග්නීසියම් ඌණතාවයයි
4) පොස්පරස් ඌණතාවයයි

19) ශාකවලට අත්‍යාවශ්‍යම මහා පෝෂක පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

1) කාබන්, බෝරෝන් හා නයිට්‍රජන්
2) පොස්පරස්, ක්ලෝරීන් හා මැග්නීසියම්
3) පොටැසියම්, කැල්සියම් හා නයිට්‍රජන්
4) මැග්නීසියම්, සින්ක් හා යකඩ

20) කාබනික පොහොර සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A- ශාක පෝෂණයට අවශ්‍ය සියලු පෝෂක අඩංගු වේ.
B- පසේ කැටායන හුවමාරු ධාරිතාවය වැඩිදියුණු කරයි.
C- කුඩා ප්‍රමාණයක් යෙදීමෙන් පෝෂක අවශ්‍යතාවය සපුරා ගත හැකිය.

මෙම ප්‍රකාශ අතරින් කාබනික පොහොර සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශ වන්නේ

1) A හා B ය
2) A හා C ය
3) B හා C ය
4) A, B හා C ය

21) පළල් පත්‍ර වල්පැළෑටි පමණක් අඩංගු වන පිළිතුර තෝරන්න.

1) බටදැල්ල, ඇටවරා හා ඇපල
2) බැලතණ, කලාදුරු හා ඉලුක්
3) බජිරි, තුනැස්ස හා කුප්පමේනියා
4) දියහබරල, කුප්පමේනියා හා ජපන් ජබර

22) කෙසෙල් ශාකයක පත්‍ර කුඩා වී එකිනෙකට ආසන්නව සැකසී වර්ධනයද බාල වීමක් නිරීක්ෂණය විය. මෙම තත්ත්වයට හේතුව විය හැක්කේ

1) දිලීර ආසාදනයකි
2) වෛරස් ආසාදනයකි
3) බැක්ටීරියා ආසාදනයකි
4) වටපණු ආසාදනයකි

23) පෙරමෝන යෙදූ උගුලක් මගින් පහසුවෙන් පාලනය කළ හැකි පලිබෝධකයන් වන්නේ

1) පළතුරු මැස්සා හා ඉල්මැස්සා
2) ගොයම් මැස්සා හා සුදු මැස්සා
3) පුරුක් පණුවා හා එපිලැක්නාය
4) පිටිමකුණා හා අවුලකපෝරාය

24) පලිබෝධකයන් හානි කරන බෝග වර්ග හා බෝගවල කොටස් ඇතුළත් වගුවක් පහත දැක්වේ.

| | පළිබෝධකයා | හානිකරන බෝගය | හානිකරන කොටස |
|---|---|---|---|
| A | පුරුක්පණුවා | බඩඉරිඟු | කඳ |
| B | අවුලකපෝරා | මිරිස් | පත්‍ර |
| C | ඉල්මැස්සා | වැටකොළු | ඵල |
| D | සුදුමැස්සා | කරවිල | මුල් |

මෙම වගුවේ තොරතුරු අනුව පලිබෝධකයා, හානිකරන බෝගය හා හානිකරන කොටස නිවැරදිව දක්වා ඇති පේළිය වන්නේ

1) A ය 2) B ය 3) C ය 4) D ය

25) ගොයම් පැළයක වර්ධක අවධිය ලෙස හඳුන්වනු ලබන්නේ

1) පුෂ්ප මූලාකෘති ඇතිවීමේ සිට පීදීම් දක්වා කාලයයි
2) පීදීමේ සිට අස්වනු නෙලීම දක්වා කාලයයි
3) බීජ ප්‍රරෝහණයේ සිට අස්වනු මේරීම දක්වා කාලයයි
4) බීජ ප්‍රරෝහණයේ සිට පුෂ්ප මූලාකෘති ඇතිවීම දක්වා කාලයයි

26) වී වගාවක තැනින් තැන කහ පැහැ ගැන්වී වියළී පිළිස්සී ගිය වෘත්තාකාර ප්‍රදේශ දක්නට ලැබුණි. මෙම තත්ත්වයට හේතුවන පලිබෝධකයා වන්නේ

1) ගොයම් මකුණා ය 2) දුඹුරු පැළකීඩෑවා ය
3) පැළ මැක්කා ය 4) කුඩිත්තා ය

27) බීජවල ප්‍රරෝහණ ප්‍රතිශතය සෙවීමට පෙඟවූ බීජ 80 ක් පෙට්‍රිදීසියක තැන්පත් කරන ලදි. එයින් බීජ 60 ක් ප්‍රරෝහණය වී තිබුණි. එම වී සාම්පලයේ ප්‍රරෝහණ ප්‍රතිශතය

1) 40% කි 2) 50% කි 3) 65% කි 4) 75% කි

28) ධාවක මඟින් ප්‍රචාරණය කරනු ලබන බෝග වර්ග ඇතුළත් වරණය තෝරන්න.

1) රතුළූණු සහ කහ 2) ස්ට්‍රෝබෙරි සහ සලාද
3) ගොටුකොළ සහ බතල 4) මුකුණුවැන්න සහ තම්පලා

29) සිටුවීමට ගන්නා බීජවල ලක්ෂණ පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A- ඉහළ ප්‍රවේනික පාරිශුද්ධත්වයක් පැවතීම
B- බොල්බීජ වලින් තොර වීම
C- බීජවල ප්‍රරෝහණ ප්‍රතිශතය 65% ක් වීම

ඉහත ලක්ෂණ අතරින් සිටුවීම සඳහා ගන්නා බීජවල පැවතිය යුතු ලක්ෂණ වන්නේ

1) A හා B ය 2) A හා C ය 3) B හා C ය
4) A, B හා C යන සියල්ලම ය

30) වාණිජ මට්ටමින් පැළ නිෂ්පාදනයේ දී අතු කැබලි මුල් ඇද්දවීම සඳහා කෘතිම රසායනික හෝර්මෝන යොදා ගනී. එවැනි හෝර්මෝනයක් වන්නේ

1) ඊත්‍රල් ය 2) ඉන්ඩෝල් ඇසිටික් අම්ලය
3) මීතයිල් බ්‍රෝමයිඩ් ය 4) මීතයිල් ඉයුජිනෝල් ය

31) වායුගෝලීය තත්ත්ව සමඟ සන්සන්දනය කිරීමේදී සරල සූර්ය ප්‍රචාරකයක් තුළ

1) සාපේක්ෂ ආර්ද්‍රතාවය අඩු අතර උෂ්ණත්වය වැඩි අගයක් ගනී.
2) සාපේක්ෂ ආර්ද්‍රතාවය වැඩි අතර අඩු උෂ්ණත්වයක් පවතී.
3) සාපේක්ෂ ආර්ද්‍රතාවය හා උෂ්ණත්වය ඉහළ අගයක් ගනී.
4) උෂ්ණත්වය හා සාපේක්ෂ ආර්ද්‍රතාවය පහළ අගයක් ගනී.

32) නිර්පාංශු වගාවේදී පෝෂණය සැපයීමට බහුලව භාවිතා වන පෝෂණ මාධ්‍යයක් වන්නේ
1) ඒගාර් මාධ්‍යය
2) බ්‍රෝඩෝ මිශ්‍රණය
3) ජීතුල් මාධ්‍යය
4) ඇල්බට් මිශ්‍රණය

33) ශෂ්‍ය බෝග මාරු වගා රටාවේ සිව් බෝග මාරුව සඳහා වඩාත් සුදුසු බෝග වර්ග ඇතුළත් වරණය තෝරන්න.
1) මිරිස්, බඩඉරිඟු, වට්ටක්කා හා කව්පි
2) බඩඉරිඟු, මුං, බතල හා බණ්ඩක්කා
3) කව්පි, වට්ටක්කා, දඹල හා මිරිස්
4) මුං, බතල, බටු හා තක්කාලි

34) භූමියක වගාකර ඇති ප්‍රධාන බෝගය අතර එම බෝගයට තරගයක් ඇති නොවන පරිදි වෙනත් බෝගයක් හෝ කිහිපයක් ක්‍රමවත්ව වගා කිරීම
1) සමෝධානිත ගොවිතැනයි
2) කඩින් කඩ වගාවයි
3) අතුරු බෝග වගාවයි
4) වීදි බෝග වගාවයි

35) කෘෂි අස්වනු ගොවිපලේ සිට වෙළඳ පොළ දක්වා යැවීමේ ක්‍රියාවලියේ පියවර නිවැරදිව දක්වා ඇති වරණය කුමක් ද?
1) අස්වනු නෙළීම → සැකසීම → ඇසිරීම → ප්‍රවාහනය → ගබඩා කිරීම → අලෙවිය
2) අස්වනු නෙළීම → ඇසිරීම → ප්‍රවාහනය → සැකසීම → ගබඩා කිරීම → අලෙවිය
3) අස්වනු නෙළීම → ප්‍රවාහනය → සැකසීම → ඇසිරීම → ගබඩා කිරීම → අලෙවිය
4) අස්වනු නෙළීම → ඇසිරීම → සැකසීම → ප්‍රවාහනය → ගබඩා කිරීම → අලෙවිය

36) නියමිත මේරීමේ අවස්ථාවේදී අස්වනු නෙලා නොගැනීමෙන් තන්තුමය ස්වභාවය වැඩිවීමෙන් පරිභෝජනය කළ නොහැකි තත්ත්වයට පත්වන අස්වනු වන්නේ
1) රඹුටන් හා දූරියන් ය
2) පැපොල් හා කෙසෙල් ය
3) අඹ හා සලාද ය
4) වැටකොළු හා බණ්ඩක්කා ය

37) පෝෂණ ඌණතා අතර ඛනිජ ලවණ ඌණතාවය ද පෝෂණ ගැටළුවකි. යකඩ ඌණතාවය නිසා ඇතිවන රෝගී තත්ත්වයක් වන්නේ
1) තමස් අන්ධතාවය
2) රක්තහීනතාවය
3) ගලගණ්ඩය
4) රිකට්සියාව

38) බටර්, පොල්තෙල් හා තෙල් අඩංගු රසකැවිලි උෂ්ණත්වයට හා වාතයට නිරාවරණය වීම නිසා මුඩු වීමේ තත්ත්වයට පත් වේ. මෙලෙස සිදුවන්නේ
1) ඔක්සිකරණ ක්‍රියාවලිය නිසාය
2) නයිට්‍රිකරණ ක්‍රියාවලිය නිසාය
3) ඔක්සිහරණ ක්‍රියාවලිය නිසාය
4) සාන්ද්‍රීකරණ ක්‍රියාවලිය නිසාය

39) ආහාර විෂවීම සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A- මඤ්ඤොක්කාවල අඩංගු ලිනමරින් නිසා නිපදවන සයනයිඩ් සංයෝග ආහාර විෂවීමට හේතු වේ.
B- ආම්ලික ආහාර ලෝහ බඳුන්වල පිසීම නිසා ඊයම් වැනි ලෝහ ආහාරයට මිශ්‍ර වීමෙන් ආහාර විෂවීම් ඇතිවේ.
C- ආහාර මත ක්ෂුද්‍ර ජීවීන් ක්‍රියා කිරීම නිසා ද ආහාර විෂවීම් සිදුවේ.
ඉහත ප්‍රකාශ අතරින් ආහාර විෂවීම් සම්බන්ධව නිවැරදි ප්‍රකාශ වන්නේ
1) A හා B පමණි
2) A හා C පමණි
3) B හා C පමණි
4) A, B හා C යන සියල්ල ම

40) ආහාර අධික උෂ්ණත්වයකට භාජනය කර ක්ෂණිකව සිසිල් කර අඩු උෂ්ණත්වයක ගබඩා කර තැබීමේ ආහාර පරිරක්ෂණ කිරීම
1) පැස්චරීකරණය නම් වේ
2) ජීවාණුහරණය නම් වේ
3) බ්ලාන්ච් කිරීම නම් වේ
4) සාන්ද්‍රීකරණය නම් වේ